රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

මෙම ආයතනය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවා සපයනු ලබන කොන්ත්‍රාත්කරුවන්, සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් වෙතින් ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**(A) සැපයුම්**

01. සියලුම කාර්යාලයීය ලිපිද්‍රව්‍ය
02. සියලුම මුද්‍රණ කටයුතු
03. විදුලි උපාංග
04. ගොඩනැගිලි ද්‍රව්‍ය (ගල්, වැලි, සිමෙන්ති, පස්, යකඩ, තීන්ත ආදිය)
05. පරිගණක හා ඡායා පිටපත් යන්ත්‍ර සඳහා ලිපි ද්‍රව්‍ය (රිබන්, ටෝනර්)
06. සියලුම වර්ගයේ කාර්යාලයීය ලී බඩු හා වානේ උපකරණ සැපයීම
07. කාර්යාලයීය උපකරණ - (පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, මල්ටි මීඩියා උපකරණ හා වෙනත්)
08. වායු සමීකරණ යන්ත්‍ර සපයා සවිකිරීම.
09. නිල ඇඳුම් හා කාර්යාලයීය තිර රෙදි සැපයීම
10. නිල හැඳුනුම්පත් සකස් කිරීම
11. නාන කාමර උපාංග සැපයීම

**(B) සේවාවන්**

01. පරිගණක සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු.
02. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තු කටයුතු.
03. ලොන්ඩ්‍රි සේවා.
04. කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම - (ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, මුද්‍රණ, ස්කෑන්, මල්ටිමීඩියා යන්ත්‍ර සහ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ)
05. අභ්‍යන්තර දුරකථන සැපයීම හා නඩත්තුව.
06. ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සහ සේවා සැපයීම.
07. වාහන කුලියට ලබා ගැනීම. (මෝටර් රථ, බස් රථ, වෑන් රථ, ලොරි රථ සහ ත්‍රි රෝද රථ)
08. උත්සව අවස්ථාවන් සඳහා උත්සව භාණ්ඩ සැපයීම (ටෙන්ට්, පුටු, මේස ආදිය)
09. වීඩියෝගත කිරීම සහ නිශ්චල ඡායාරූපකරණය
10. ආහාරපාන සැපයීම.
11. පවිත්‍රතා සේවාවන් සැපයීම.
12. කැළි කසල ඉවත් කිරීම
13. ආරක්ෂක සේවාවන් සැපයීම.
14. උද්‍යාන අලංකරණ සේවාවන් සැපයීම. (මල් පැල, මල් පෝච්චි, පොහොර, බීජ ආදිය)
15. කාර්මික / කම්කරු සේවා සැපයීම (විදුලි කාර්මික / ටයිල් මේසන්වරු /මේසන්වරු / වඩු කාර්මික / ජලනල වැද්දුම්කරු / කම්කරු)

**(C) වාහන උපාංග සැපයීම / අලුත්වැඩියා හා සේවා සැපයුම්**

01. සියලුම වර්ගයේ වාහනවල ටයර්, ටියුබ්, රිම්ටේප්, බැටරි සැපයීම හා සවිකිරීම, වීල් බැලන්ස් කිරීම සහ එලයින්මන්ට් පරීක්ෂා කිරීම.
02. සියලුම වර්ගයේ වාහන වල යාන්ත්‍රික අලුත්වැඩියාවන් (යාන්ත්‍රික හා විදුලි යනාදිය)
03. සියලුම වර්ගයේ වාහන වල වායුසමීකරණ සවිකිරීම, අලුත්වැඩියාව සහ සේවාවන් සිදු කිරීම.
04. සියලුම වර්ගයේ වාහනවල කුෂන් වැඩ, සීට් කවර දැමීම, කලාල දැමීම හා වාහන ඇතුළත පිරිසිදු කිරීම.
05. මෝටර් රථ, බස් රථ, ලොරි රථ හා ත්‍රිරෝද රථ සේවා කිරීම.

**(D) කොන්ත්‍රාත්කරුවන්**

01. සිවිල් වැඩ (ඇලුමිනියම් වැඩ, මේසන් වැඩ, වඩු වැඩ, පින්තාරු වැඩ, ජල කාන්දු නිවාරණය, උද්‍යාන නඩත්තු, ඉන්ටීරියර් වැඩ)
02. විදුලි වැඩ සහ නඩත්තුව
03. යාන්ත්‍රික වැඩ - (ජල නල, වතුර පොම්ප අලුත්වැඩියාව, මළ අපවහන නල මාර්ග)

**සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු**

01. සෑම අයදුම්පතක් සමඟම ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය.
02. අයදුම්පතක් පරික්ෂාකොට ඒවා පිළිගැනීම හෝ හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීම මෙම කාර්යාලය සතුවේ.
03. ආයතනයේ අවශ්‍යතා සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන අතර ප්‍රමාණවත් සැපයුම්කරුවන් නොමැති විට හෝ අවශ්‍යවන්නේ නම් වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලබා ගැනීමේ අයිතියද මෙම ආයතනය සතුය.
04. ලියාපදිංචි වන සියලුම සැපයුම්කරුවන් දින 45 ක ණය කාලයක් ලබා දිය යුතුය. ඇණවුම් භාණ්ඩ නොමිලේ ප්‍රවාහනය කිරීමට එකඟ විය යුතුය. ඇණවුම් සඳහා කලින් ගෙවීම් බලාපොරොත්තුවන්නන් හෝ ප්‍රවාහන ගාස්තු අයකරනු ලබන අයවලුන් ලියාපදිංචි කරනු නොලැබේ.
05. මිල ගණන් කැඳවූ පසු අඛණ්ඩව අවස්ථා තුනකදී ප්‍රතිචාර ඉදිරිපත් කිරීමට අපොහොසත්වන සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.
06. ඇණවුම් ලබාදීමෙන් පසු නියම කරන ලද කාලය තුළදී සැපයුම් ගෙනැවිත් භාරදීමට අපොහොසත්වන හෝ සිය සැපයුම් අදාළ පිරිවිතර හා නියැදි වලට අනුකූල නොවන සැපයුම්කරුවන් අසාධු ලේඛනගත කරනු ලැබේ.
07. ලියාපදිංචි කිරීමෙන් පසු කොන්දේසි උල්ලංඝණය කිරීම සැපයුම්කරුවාගේ නම ලියාපදිංචි නාම ලේඛනයෙන් ඉවත් කිරීමට හේතු වේ.
08. පෙර වර්ෂ සඳහා ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ද 2024 වර්ෂය සඳහාද අයදුම් කල යුතු බව කරුණාවෙන් සලකන්න.
09. අයදුම්පත් ලබාගැනීම සඳහා ව්‍යාපාර ලිපි ශීර්ෂයකින් කෙරෙන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු අතර අදාල අයදුම්පත් මෙම ආයතනය වෙත පැමිණ ලබා ගත යුතුය.
10. එක් අයිතමයක් සඳහා ලියාපදිංචි ගාස්තුව රු. 500.00 (රුපියල් පන්සිය) කි. එක් එක් කාර්යයන් සඳහා වෙන වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතුය.
11. අයදුම්පත්‍ර මෙම පුවත්පත් දැන්වීම් දින සිට **2023.12.28** දින ප.ව. **2.00** දක්වා ආයතනයේ සරප් වෙත මුදලින් පමණක් ගෙවීමෙන් පසු පාලන අංශයෙන් ලබාගත හැකිය.
12. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත 2024.01.08 ප.ව. **4.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ අතින් හෝ ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ-07. යන ලිපිනයට එවිය යුතුය.
13. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2024"** යනුවෙන් සඳහන් කල යුතුය.
14. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980271/ 011-5980293 ඇමතීමෙන් ලබාගත හැකිය.


අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය,
28/10 මලලසේකර මාවත,
කොළඹ 07

**දු.ක. අංක : 011-5980200 ෆැක්ස් : 011-2584406 ඊ-මේල් : mail@slida.gov.lk**